# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## පරිගණක ක්‍රමලේඛක තනතුර සඳහා බඳවා ගැනීම (බාහිර )

ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

### 1. <u>රැකියා විස්තරය සහ වගකීම්</u>

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අවශ්‍ය පරිගණක වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.
2. අභ්‍යන්තර දත්ත ජාලය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.
3. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර සන්නිවේදන ජාල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ අන්තර්සම්බන්ධතා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.
4. කාර්යක්ෂම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ යෙදුම් පද්ධති සහතික කිරීම මඟින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමණාකාරිත්වයට සහාය වීම.

### 2. <u>අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය විෂයය සහිත උපාධියක් ලබා තිබීම .

**සහ**

පරිගණක වැඩසටහන්කරණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබාගත් පසු අවම වශයෙන් වසර 03ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

### <u>3. බඳවා ගැනීමේ පටිපාටිය</u>

ලිඛිත තරඟ විභාගය, ප්‍රායෝගික පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් ලබාගන්නා කුසලතා ප්‍රතිඵල පදනම් කරගෙන බඳවා ගැනීම් සිදු කෙරේ.

තරඟ විභාගය, ප්‍රායෝගික පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් ලබාගන්නා සමස්ත ලකුණු එකතුව මත පදනම්ව, සුදුසුකම් අනුව පමණක් පත්වීම් සිදු කරනු ලැබේ.

ලිඛිත විභාගයේ විෂයයන්:

අ) භාෂා ප්‍රවීණතාවය සහ හැකියා පරීක්ෂණය – පැය 2 – ලකුණු 100
ආ) තනතුරට අදාළ විෂය දැනුම – පැය 2 – ලකුණු 100

**3.1 ප්‍රායෝගික පරීක්ෂණය: :**

මෙම පරීක්ෂණයේ අරමුණ වන්නේ අපේක්ෂකයාගේ විෂය දැනුම සහ කුසලතා ප්‍රායෝගික තත්ත්වයකදී භාවිතා කිරීමේ හැකියාව ඇගයීමයි. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ සිද්ධාන්තයක් හෝ අත්දැකීමක් (case / experience) ලබාදෙන අතර, නියමිත කාල සීමාව තුළ අපේක්ෂකයා ලබාදෙන ප්‍රතිචාරය ඇගයීමට ලක් කරනු ලැබේ.

බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා, එක් එක් විෂයයට නියමිත ලකුණු වලින් අවම වශයෙන් 40%ක් සහ සමස්ත ලකුණු එකතුවෙන් අවම වශයෙන් 50%ක් ලබාගත යුතුය.

**<u>4. වැටුප් පරිමාණය:</u>**

(1) TRC 4.1 - 118,239 - (10x2112)-(10x2816)-(10x3519) -(10x4223)-244,939

**<u>5. වයස</u>** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.18-45 අතර විය යුතුය.

**6.පොදු කොන්දේසි:**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕිනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා ඍජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය

**7. අයදුම් කිරීමේ ක්‍රමය :**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk වෙතින් බාගත කරගත හැකිය..
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2026.06.01 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පරිගණක ක්‍රමලේඛක තනතුරට බඳවා ගැනීම (බාහිර) යනුවෙන් සඳහන් කළ යුතුය.**
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපැලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව " **පරිගණක ක්‍රමලේඛක තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2026"** විය යුතුය.

7. රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2026.06.01** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276, ඇල්විටිගල මාවත
කොළඹ 08